අඹන්ගඟකෝර්ලේ ප්‍රාදේශීය සභාව
මාතලේ දිස්ත්‍රික්කය

-----------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට අඹන්ගඟකෝර්ලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සිරංගහවත්ත ජල යෝජනා ක්‍රමය සංවර්ධනය කිරීම වෙනුවෙන් රු.464,577 ක වියදමක් දරා ඇතත් රු.396,000 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | විගණන විමසුම හා එකඟ වන අතර 2019.12.31 දිනට අවසන් ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | යන්ත්‍ර හා උපකරණ යටතේ රු.136,947 ක් වටිනා ටයර් හා ටියුබ්, වාහන බැටරි ගිණුම්ගත කිරීමෙන් ජංගම නොවන වත්කම් එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | විගණන විමසුම හා එකඟ වන අතර 2019 දෙසැම්බර් 31 දිනට අවසන් ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

1.3.2 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

තොරතුරු ඉදිරිපත් නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.3,530,691 ක් වූ | මූල්‍ය ප්‍රකාශනවල | විගණන විමසුම හා එකඟ වන |

| | | |
|---|---|---|
| ගිණුම් විෂයයන් 13 කට අදාළව විගණන සාක්ෂි ඉදිරිපත් නොකිරීම මත විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | අතර, විමසුමේ සඳහන් පරිදි මෙම ගිණුම් විෂයයන් 13 ට අදාළව තොරතුරු කාර්යාලය තුළින් සොයාගත නොහැකි නිසා තොරතුරු විගණනයට ඉදිරිපත් කිරීමට නොහැකි වි ඇත. |

1.4 අනුකූල නොවීම
-------------------

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම
---------------------------------------------------------------------------

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති අංක 217 | සියලුම ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | රීති ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කර නඩත්තු කළ යුතු වේ. | එකඟ වෙමි. |

2. මූල්‍ය සමාලෝචනය
------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.803,539 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,541,806 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
------------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්
-----------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු | රු. | රු. | රු. |
| (i) | වරිපනම් බදු | 101,000 | 12,005 | 10,258 | 50,638 | - | - | - | - |
| (ii) | කඩ කුලී | 147,000 | 96,600 | 105,030 | 16,160 | 13,000 | 96,600 | 90,655 | 24,590 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 335,100 | 294,016 | 294,016 | - | 36,000 | 298,600 | 298,600 | - |
| (iv) | වෙනත් ආදායම් | 4,926,732 | 3,276,844 | 3,276,844 | - | 471,600 | - | 2,128,520 | - |
| | එකතුව | 5,509,832 | 3,679,465 | 3,686,148 | 66,798 | 520,600 | 395,200 | 2,517,775 | 24,590 |

### 2.2.2 අක්කර බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.50,638 ක හිඟ ශේෂයක් පැවති අතර එහි පුද්ගලයන් 61 දෙනෙකුගෙන් අයවිය යුතු වර්ෂ 5 ක් ඉක්මවූ රු.30,720 ක හිඟ ශේෂයක් පැවතුණි. | හිඟ ශේෂයන් අය කර ගත යුතු වේ. | එකඟ වෙමි. |

### 2.2.3 ජල ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් පවත්වාගෙන යනු ලබන ජල යෝජනාක්‍රම 8 කට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ ජල ගාස්තු ආදායම රු.423,363 ක් වූ අතර ඒ තුළ ජල පාරිභෝගිකයින් 15 දෙනෙකුගෙන් අය විය යුතු වර්ෂ 5 ක් ඉක්මවූ රු.18,355 ක ශේෂයක් ද විය. | තවදුරටත් හිඟව පවතින ගාස්තු අය කරගත යුතු වේ. | 2018 දෙසැම්බර් 31 දිනට පැවති රු.423,363 ක ජල ගාස්තු හිඟයෙන් රු.23,578 ක් මේ වන විට අය කරගෙන ඇත. |

### 2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.159,750 ක් සහ මුද්දර ගාස්තු රු.1,554,150 ක් විය. | හිඟ මුද්දර ගාස්තු හා උසාවි දඩ අය කර ගතයුතු වේ. | සමාලෝචිත වර්ෂයේ අය වීමට තිබූ හිඟ උසාවි දඩ මුදල රු.151,750 ක් වන අතර ඉන් රු.99,750 ක් මේ වන විට අයවී ඇත. |

සමාලෝචිත වර්ෂයේ හිඟ මුද්දර ගාස්තු රු.1,457,900 ක් වේ.

3. මෙහෙයුම් සමාලෝචනය
------------------------------

3.1 කාර්යසාධනය
------------------

(අ) කර්තව්‍යයන් ඉටු නොකිරීමේ ප්‍රමාදයන්
---------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂයේදී පළාත් පාලන මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ රු.100,000 ක ප්‍රතිපාදන අනුමතව තිබූ පුස්සැල්ල වසම රාජමලේ සිට උඩ අස්වැද්ද මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ඉටු නොකර අත්හැර දමා තිබුණි. | සංවර්ධන කාර්යයන් නිසි පරිදි ඉටුකරවා ගත යුතු වේ. | 2018 වර්ෂයේ අවසන් වන තුරු එම කර්මාන්තය ඉටු නොකිරීම නිසා ව්‍යාපෘතිය අවසන් කිරීමට නොහැකි වූ බව පිළිගනිමි. |

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක
------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව විධිමත් පරිදි දැනුවත්ව නොතිබීම හේතුවෙන් ඒ සඳහා වන දිගු කාලීන සැලසුම් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක සකස් කර අදාළ ඉලක්ක ඉටු කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | එකඟ වෙමි. |

3.2 මානව සම්පත් කළමනාකරණය
-------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සංවර්ධන නිලධාරි තනතුරු 4 ක් හා පෙර පාසැල් ගුරු තනතුරු 2 ක් දීර්ඝ කාලයක සිට පුරප්පාඩුව පැවති අතර ප්‍රාථමික මට්ටමේ තනතුරු 6 ක් පුරප්පාඩුව පැවතුණි. | පුරප්පාඩු වූ තනතුරු සම්පූර්ණ කරවා ගතයුතු වේ. | පුරප්පාඩු වී පවතින ආයතනගත තනතුරු සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණය පවත්වා අවසන් කර ඇත. |

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුළ සභාව මගින් නඩත්තු කරන ජල යෝජනාක්‍රම 8 ක පානීය ජලයේ යෝග්‍යතාවය පරීක්ෂා කිරීමට කටයුතු කර නොතිබුණි. | පානීය ජලයේ යෝග්‍යතාවය පරීක්ෂා කළ යුතු වේ. | එකඟ වෙමි. |

3.4 වත්කම් කළමනාකරණය

3.4.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වැට මායිම් නිශ්චිතව නොමැති සහ හිමිකම් ඔප්පු නොමැති සභාව සතු ඉඩම් 11 ක් සඳහා මැනුම් කටයුතු සිදුකර පිඹුරුපත් සකස් කර නොතිබුණි. | මැනුම් කටයුතු අවසන් කර වැට මායිම් සකස් කර වත්කම් ආරක්ෂා කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | රජයේ මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් සභාව සතු ඉඩම් මැනීම සඳහා අවශ්‍ය කටයුතු කර ඇත. |
| (ආ) | සභාව සතු අත්ට්‍රැක්ටරයේ හා මහේන්ද්‍රා කැබ් රථයේ ලියාපදිංචි පොත් අස්ථානගතව තිබීම නිසා වසර ගණනාවක සිටම ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබූ අතර වාර්ෂික රක්ෂණය ද සිදුකර නොතිබුණි. | ලියාපදිංචි සහතිකවල පිටපතක් ලබාගෙන අනෙකුත් කාර්යයන් ඉටු කළයුතු වේ. | විගණන විමසුම හා එකඟ වන අතර අදාළ වාහනවල ලියාපදිංචි සහතිකයේ පිටපත් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු ඉටුකර ඇත. |

3.4.2 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2007 වර්ෂයේදී මධ්‍යම පළාත් සභාවෙන් ලබාදී තිබූ යතුරුපැදිය සභාවේ නමට පවරාගෙන නොතිබුණි. | අයිතිය පවරා ගත යුතු වේ. | 2007 වර්ෂයේ සභාවට ලබාදී තිබූ CPTX - 6009 දරන යතුරුපැදිය පවරා ගැනීම සඳහා මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්තුමා වෙත අවශ්‍ය අයදුම්පත් ඉදිරිපත් කොට ඇත. |

## 3.4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වාහන හා යන්ත්‍රෝපකරණ අයිතම 5 ක් භාවිතයට ගැනීමට නොහැකිව විනාශ වීමට ඉඩ හැර තිබුණි. | අපහරණය කළ යුතු වත්කම් අපහරණය කළ යුතු වේ. | වාහන හා යන්ත්‍රෝපකරණ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා තක්සේරු වටිනාකම තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කර ඇත. |
| (ආ) | ධාවන තත්ත්වයේ පවතින ටිපර් රථයක් හා ඩම්ප් ට්‍රක් රථයක් ඌන උපයෝජිතව පැවති අතර මහේන්ද්‍රා කැබ් රථයක් 2017 වර්ෂයේ දෙසැම්බර් මස සිට කාර්මික දෝෂයක් හේතුවෙන් ධාවනයෙන් ඉවත්කර තිබුණි. | සභාව සතු වාහන ඵලදායීව සේවයේ යෙදවීම හා අලුත්වැඩියා කළ යුතු වාහන අලුත්වැඩියා කර සේවයේ යෙදවිය යුතු වේ. | රියදුරන් නොමැතිකම නිසා ටිපර් රථය හා ඩම්ප්ට්‍රක් රථය වැඩි වශයෙන් ධාවනයට යොදා නොගත්තත් අත්‍යාවශ්‍ය අවස්ථාවලදී ධාවනයට යොදා ගැනේ. අක්‍රිය තත්ත්වයේ පවතින මහේන්ද්‍රා කැබ් රථය අලුත්වැඩියා කිරීමට කටයුතු කරමි. |

## 3.5 ප්‍රසම්පාදනය

### ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 අනුව ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලසුම් යාවත්කාලීනව සිදු කළ යුතු වේ. | විගණන විමසුම හා එකඟ වන අතර ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමට අවශ්‍ය පුහුණු නිලධාරියෙකු නොමැතිවීම නිසා මෙම අතපසුවීම සිදුව ඇත. |

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------------

විගණන හා කළමනාකරණ කමිටු

---------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළ එක් විගණන හා කළමනාකරණ කමිටුවක් පමණක් පවත්වා තිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීම කළ යුතුවේ. | එකඟ වෙමි. |